''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; II කලාපය; 2023 නොවැම්බර්; පිටු: 51-60

# කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ගෝලීය ප්‍රයත්නයන්

**පී. ඩී. විජේසේකර[1] සහ ටී. එම්. එස්. පී. කේ. තෙන්නකෝන්[2]**
[1 & 2] අන්තර්ජාතික බහුවිෂයයික පර්යේෂණ මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
[1] pdwijesekara@sjp.ac.lk

**සංක්ෂේපය**
ගෝලීය ජනගහනයෙන් අඩක් කාන්තාවන් (49.7%) විසින් නියොජනය කරයි. ප්‍රජනනය හා වර්ගයා බෝ කිරීම හැරුණු කොට මානව ඉතිහාසයේ ගමන් මග සකස් වීමේදී කාන්තාවන්ගේ කාර්යයභාරය ලෝකයේ සෑම ජන සංස්කෘතියකම සුවිශේෂී ස්ථානයක් හිමිකරගනී. ලොව පුරා කාන්තාවන් සහ ගැහැණු ළමයින් වයස, කුලය, ජාතිකත්වය, ආදිවාසී තත්ත්වය, ලිංගිකත්වය, ජීවත් වන ප්‍රදේශය, ආගම, පවුලේ තත්ත්වය, සංක්‍රමණික භාවය, ආදායම සහ විවාහක භාවය වැනි ස්ව කැමැත්තෙන් තෝරා ගත් හෝ නොගත් බොහෝ කුලකයන් වලට අයත් කොට සළකනු ලබන අතර මෙම බෙදා දැක්වීම් හේතුවෙන්ම තමන්ට ලැබිය යුතු මූලික අයිතිවාසිකම් අතින් වෙනස්කම් වලට භාජනය වේග ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම, ප්‍රචණ්ඩත්වය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා අසමාන ප්‍රවේශය සහ නායකත්ව දේශපාලන භූමිකාවන්හි අඩු නියෝජනය ඇතුළු අභියෝගවලට කාන්තාවන් සහ ගැහැණු ළමයින් අඛණ්ඩව මුහුණ දෙති. මෙම අභියෝග ආමන්ත්‍රණය කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සමාජ සාධාරණත්වය පිළිබඳ කාරණයක් පමණක් නොව සැමට වඩා සාධාරණ හා සමෘද්ධිමත් ලෝකයක් සහතික කිරීම සඳහා වන මූලික අවශ්‍යතාවයකි. මෙම ගවේෂණය තුළින් අධ්‍යාපනය, සෞඛ්‍යය, ආර්ථික සවිබල ගැන්වීම, දේශපාලන සහභාගීත්වය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඉදිරියට ගෙන යාම සඳහා දැනට පවතින හා පැවතුන ගෝලීය ප්‍රයත්නයන් විමසීමට ලක්කිරීම මූලිකවම අරමුණු කරයි.

**මුඛ්‍ය පද:** කාන්තාව, ගෝලීය ප්‍රයත්නයන්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව

## හැඳින්වීම

වසර 2022 වන විට ගෝලීය ජනගහනයෙන් අඩක් (49.7%) (World Bank, 2023) පමණ වන කාන්තා ජනගහනය සෑම අතින්ම සමාජයේ අද්විතීය කාර්යභාරයක් දරයි. ඔවුන් පවුල සහ ප්‍රජාවේ සිට ශ්‍රම බලකාය, දේශපාලනය, විද්‍යාව, කලාව සහ ඉන් ඔබ්බට සමාජයේ සෑම අංශයකටම දායකත්වය ලබා දෙන ගතික ප්‍රජාවකි. ප්‍රජනනය හා වර්ගයා බෝ කිරීම හැරුණු කොට මානව ඉතිහාසයේ ගමන් මග සකස් වීමේදී කාන්තාවන්ගේ කාර්යයභාරය ලෝකයේ සෑම ජන සංස්කෘතියකම සුවිශේෂී ස්ථානයක් හිමිකරගනී. කාන්තාවන් සතු ඔරොත්තු දීමේ හැකියාව, ශක්තිය සහ හැකියාවන් නිරන්තරයෙන් පෙන්නුම් කරමින් ලෝකය තුළ ධනාත්මක වෙනස්කම් ඇති කිරීමෙලා ඔවුන් සමත්වී තිබේ. අතීතයේ සිට, කාන්තාවන් විවිධ ආගමික සංස්කෘතික බැමි වලින් බැඳී තිබියදීත් සමාජ සම්මතයන් සහ අසමානතාවලට අභියෝග කරමින්, ඡන්ද අයිතිය ලබා ගැනීමේ සිට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියහ.

තාක්ෂණය අතින් විශ්ව ගම්මානයක් දක්වා ප්‍රබෝධයක් ලබා ඇල්ෆා පරම්පරාව දක්වා මානව පරම්පරා විකාශනය වී තිබියදීත් වර්තමානය වන විටත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් කිරීම, ප්‍රචණ්ඩත්වය, නායකත්ව දේශපාලන භූමිකාවන්හි අඩු නියෝජනය, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා සඳහා අසමාන ප්‍රවේශය සහ ඇතුළු අද්විතීය අභියෝගවලට කාන්තාවන් සහ ගැහැණු ළමයින් අඛණ්ඩව මුහුණ දෙති. මෙම අභියෝග ආමන්ත්‍රණය කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සමාජ සාධාරණත්වය පිළිබඳ කාරණයක් පමණක් නොව සැමට වඩා සාධාරණ හා සමෘද්ධිමත් ලෝකයක් සහතික කිරීම සඳහා වන මූලික අවශ්‍යතාවයකි. ලොව පුරා කාන්තාවන් සහ ගැහැණු ළමයින් වයස, කුලය, ජාතිකත්වය, ආදිවාසී තත්ත්වය,

ලිංගිකත්වය, ජීවත් වන ප්‍රදේශය, ආගම, පවුල් තත්ත්වය, සංක්‍රමණික භාවය, ආදායම සහ විවාහක භාවය වැනි ස්වකැමැත්තෙන් තෝරා ගත් හෝ නොගත් බොහෝ කුලකයන් වලට අයත් කොට සළකනු ලබන අතර එහි ප්‍රතිඵලයක් ලෙස තමන්ට ලැබිය යුතු මූලික අයිතිවාසිකම් අතින් වෙනස්කම් වලට භාජනය වේ (UN Woman, 2018). පුරුෂයන්ට සාපේක්ෂව කාන්තාවන් විවිධ අකටයුතුකම් වලට ලක්වීම සුලභව දක්නට ලැබෙන අතර තමා පිළිබඳ හෝ තම ජීවිතය පිළිබඳ තීරණ ගැනීමේ අයිතිය බොහෝ විට කාන්තාවන්ට නොලැබී යාම හේතුවෙන් පීඩාවට පත්වීම ස්ථානීය හෝ අවකාශීය වශයෙන් වෙනස්කම් සහිතව වුවත් පොදුවේ දක්නට ලැබේ. මෙම ගවේෂණය තුලින් අධ්‍යාපනය, සෞඛ්‍යය, ආර්ථික සවිබල ගැන්වීම, දේශපාලන සහභාගීත්වය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉදිරියට ගෙන යාම සඳහා දැනට පවතින හා පැවතුන ගෝලීය ප්‍රයත්නයන් විමසා බැලීම මූලිකවම අරමුණු කරයි.

**කාන්තා අයිතිවාසිකම් දිනාගැනීමේ සන්ධිස්ථාන**

ගෝලීය වශයෙන් කාන්තා අයිතිවාසිකම්, ඔවුන්ගේ යහපැවැත්ම සහ සවිබල ගැන්වීම පිළිබඳ කතිකාවත සියවස් ගණනාවක් අතීතයේ සිට විකාශනය වී ඇත. මුල් අවධියේදී ආගමික, සංස්කෘතික රාමූන් හා සම්මතයන් තුල කාන්තාවකගේ භූමිකාවන්, වගකීම්, සීමාවන් සහ ඇයගේ ජීවනෝපාය හා යහපැවැත්ම ආදිය තීරණය විය. නූතන කාන්තා අයිතිවාසිකම් පිළිබඳ අවධානය යොමුවීමේ සැලකිය යුතු සන්ධිස්ථාන 19 වන සියවසේ අගභාගයේ සහ 20 වන සියවසේ මුල් භාගයේදී ආරම්භ වූ බව පෙනේ. කාලයාගේ ඇවෑමෙන්, උපදේශනය, අධ්‍යාපනය, ප්‍රතිපත්තිමය වෙනස්කම් සහ ජාත්‍යන්තර ප්‍රයත්නයන් කාන්තාවන් සහ ගැහැණු ළමයින් මුහුණ දෙන අයිතිවාසිකම් සහ අභියෝග පිළිබඳව සමාජය දැනුවත් කිරීමට දායක වී ඇති අතර, ඔවුන් සවිබල ගැන්වීම අරමුණු කරගත් ගෝලීය මුලපිරීම්වලට මග පාදා ඇත.

ගෝලීය කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාරයන් දෙස බලන කළ එක්සත් ජනපදයෙන් නැගී ආ සෙනිකා ෆෝල්ස් සම්මුතිය (1848) (Seneca Falls Convention) එහි ආරම්භය ලෙස සැලකේ. එලිසබෙත් කැඩි ස්ටන්ටන් (Elizabeth Cady Stanton) සහ ලුක්‍රෙෂියා මොට් (Lucretia Mott) ඇතුළු කාන්තා ක්‍රියාකාරිනියන් විසින් සංවිධානය කරන ලද මෙම සම්මුතිය එක්සත් ජනපදයේ කාන්තා ඡන්ද අයිතිය සඳහා වූ පළමු මහජන ඉල්ලීම සනිටුහන් කළේය (Morgan, 2015) .

ඉන් පසු කාන්තාවන්ගේ ඡන්ද අයිතිය සහ නීතිමය අයිතිවාසිකම් කෙරෙහි අවධානය යොමු කරන ලද ස්ත්‍රීවාදයේ පළමු රැල්ල (First-wave feminism) 19 වන සියවසේ අග සහ 20 වන සියවසේ මුල් භාගයේදී දක්නට ලැබුණි (Rampton, 2018). ඇමෙරිකානු ජාතික සුසාන් බී. ඇන්තනි (Susan B. Anthony) සහ බ්‍රිතාන්‍ය ජාතික එමෙලින් පැන්කර්ස්ට් (Emmeline Pankhurst) වැනි කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියන්, කාන්තා ඡන්ද අයිතිය ලබාගැනීම වෙනුවෙන් ප්‍රධාන භූමිකාවක් ඉටු කළහ.

ලොව පළමු ජාතික කාන්තා දිනය 1909 පෙබරවාරි 28 වන දින එක්සත් ජනපදයේ සමාජවාදී ව්‍යාපාරය විසින් සංවිධානය කරන ලදී. පසුව 1910 දී ජාත්‍යන්තර කාන්තා සම්මේලනය විසින් මාර්තු 8 ජාත්‍යන්තර කාන්තා දිනය ලෙස යෝජනා කළ අතර එතැන් සිට ගෝලීය වශයෙන් එය සමරනු ලැබේ. කාන්තාවන් පිළිබඳ ගෝලීය අවධානය දිනා ගැනීමේ පියවරක් ලෙස කාන්තා දිනය ප්‍රකාශයට පත් කිරීම වැදගත් සංදිස්ථානයක් ලෙස සැලකේ.

ස්ත්‍රීවාදය පිළිබද දෙවන රැල්ල (Second Wave of Feminism) 1960 සිට 1980 වකවානුව තුළ ප්‍රජනන අයිතීන්, රැකියා ස්ථානයේ වෙනස්කම් කිරීම සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇතුළු පුළුල් පරාසයක ගැටළු කෙරෙහි අවධානය යොමු කරමින් ඇති වූවකි (Rampton, 2018). බෙටි ෆ්‍රීඩන් (Betty Friedan) කතුවරියගේ “The Feminine Mystique” කෘතිය එක්සත් ජනපදයේ ස්ත්‍රීවාදය පිලිබද දෙවන රැල්ල අවුළුවාලීම සම්බන්ධයෙන් පුළුල් ලෙස ගෞරවයට පාත්‍ර විය. එම කෘතිය තුලින් ඇය හුදෙක් ගෙදර දොරේ වැඩ, විවාහය, ලිංගිකත්වය සහ දරුවන් ඇති දැඩි කිරීම තුළින් පමණක් කාන්තාවන්ට තෘප්තිමත් විය හැකිය යන අදහසට එරෙහිව හඬ අවදි කරන්නට සමත් විය.

මින් පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1976 සිට 1985 දක්වා කාලය කාන්තා දශකය ලෙස ප්‍රකාශයට පත් කළේය. එතුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ප්‍රවර්ධනය කිරීම සහ ලොව පුරා කාන්තාවන්ගේ සමාජ තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කර ඇත. තවදුරටත් එය ජාත්‍යන්තර මට්ටමින් කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ

සමානාත්මතාවය පිළිබඳ සැලකිය යුතු සාකච්ඡා සහ ගිවිසුම් වලට තුඩු දුන්නේය (UN.ESCAP, 1987).

1975 දී මෙක්සිකෝ නගරයේ දී පැවති ප්‍රථම ලෝක කාන්තාවන් පිළිබඳ සමුළුව කාන්තාවන් පිළිබඳව අවධානය වැඩි වශයෙන් යොමු කෙරුණු අවස්ථාවක් ලෙස සැලකේ. ගෝලීය වශයෙන් පැවැත්වූ කාන්තාවන් පිළිබඳ සමුළු සැලකීමේදී චීනයේ බීජිං හිදී පවත්වන්නට යෙදුනු කාන්තාවන් පිළිබඳ සිව්වන ලෝක සමුළුව සුවිශේෂ වේ. මෙම සමුළුව එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සංවිධානය කරන ලද අතර 1995 සැප්තැම්බර් 4 සිට සැප්තැම්බර් 15 දක්වා පැවැත්විණි. මෙම සිව්වන සමුළුව පළමු ලෝක කාන්තාවන් පිළිබඳ සමුළුවෙන් වසර 20 කට පසුව පැවත්වූ අතර, 1995 වන විට, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අසමානතාවය ආමන්ත්‍රණය කිරීමේ සහ ජීවිතයේ සෑම අංශයකින්ම කාන්තාවන් සවිබල ගැන්වීමේ අවශ්‍යතාවය පිළිබඳව ගෝලීය ප්‍රජාවගේ අවධානය යොමුව තිබිණ (United Nations, 1996). එහි ප්‍රතිඵලයක් ලෙස, එම සමුළුවේදී සම්මත කරන ලද බීජිං ප්‍රකාශනය (Beijing Declaration) එළි දැක්වුනු අතර එහිදී ගොඩනැගුනු ක්‍රියාව සඳහා වේදිකාව (Platform for Action) සංකල්පය තුළින්, කාන්තාවන් සහ දරිද්‍රතාවය, කාන්තාවන්ට එරෙහි හිංසනය, තීරණ වලට සහභාගී වීම සහ සමාන වැඩ සඳහා සමාන වැටුප් ලබා ගැනීම ඇතුළුව අවධානය යොමු කළ යුතු තීරණාත්මක ක්ෂේත්‍ර 12ක් කෙරෙහි අවධානය යොමු කරන පුළුල් ප්‍රතිපත්ති සහිත න්‍යාය පත්‍රයක් ඇති කරගැනීමට සමත් විය. එමගින් ලොව පුරා කාන්තාවන් සහ ගැහැණු ළමයින් මුහුණ දෙන විවිධ අත්දැකීම් සහ අභියෝග හඳුනා ගන්නා අතරම ජාතිය, වාර්ගිකත්වය, පන්තිය, ලිංගිකත්වය සහ ආබාධිතභාවය වැනි සාධක සමඟ ස්ත්‍රී පුරුෂ භාවයේ අන්තර් ඡේදනය අවධාරණය කරයි (UN Women, 2014). බීජිං ප්‍රකාශනය සහ ක්‍රියාව සඳහා වේදිකාව බොහෝ විට ගෝලීය වශයෙන් කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉදිරියට ගෙන යාමේ වඩාත්ම ප්‍රගතිශීලී සැලැස්ම ලෙස සැලකේ. බීජිං ප්‍රකාශනයේ අරමුණු සහ ක්‍රියාකාරීත්වය සඳහා රටවල් 189ක් සහයෝගය ප්‍රකාශ කරමින් සම්මත කරන ලදී. එය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා හවුල් කැපවීමක් පිළිබිඹු කළ ගෝලීය කාන්තා අයිතිවාසිකම් ව්‍යාපාරයේ සන්ධිස්ථානයක් විය.

කාන්තා දරිද්‍රතාවය, අධ්‍යාපනය සහ පුහුණුව, කාන්තා සෞඛ්‍යය, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, සන්නද්ධ ගැටුම්වලදී කාන්තාවන්ගේ තත්වය, බලයේ සිටින කාන්තාවන්, තීරණ ගැනීමේදී කාන්තා නියෝජනය, කාන්තාවන්ගේ ප්‍රගමනය සඳහා ආයතනික යාන්ත්‍රණය, කාන්තාවන්ගේ මානව හිමිකම්, කාන්තාවන් සහ මාධ්‍ය, කාන්තාවන් සහ පරිසරය, ගැහැණු ළමයා, කාන්තාවන් සහ ආර්ථිකය යනාදී අංශ ක්‍රියාව සඳහා වේදිකාව සංකල්පය මඟින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා හඳුනාගත් ක්ෂේත්‍රවලට අයත් වේ. මෙම තීරණාත්මක ක්ෂේත්‍ර 12 ආමන්ත්‍රණය කිරීම සඳහා රජයන්, ජාත්‍යන්තර සංවිධාන සහ සිවිල් සමාජය විසින් ගත යුතු උපායමාර්ගික අරමුණු මේ සංකල්පය මඟින් ගෙනහැර දක්වයි. තව දුරටත් එම අරමුණු කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සුරැකීම සඳහා ප්‍රතිපත්ති සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රබල රාමුවක් සපයයි.

ඒ අනුව සිව්වන ලෝක කාන්තාවන් පිළිබඳ සමුළුව ලොව පුරා කාන්තාවන් සහ ගැහැණු ළමයින් මුහුණ දෙන විවිධ අත්දැකීම් සහ අභියෝග හඳුනා ගනිමින් ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහ කාන්තා අයිතිවාසිකම් සම්බන්ධ නීති සම්පාදනය කිරීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය. විශේෂයෙන්ම එය දේශපාලනයේ කාන්තා සහභාගීත්වය, ප්‍රජනන අයිතීන්, කාන්තා හිංසනයට එරෙහිව සටන් කිරීම සහ කාන්තා ආර්ථික සවිබල ගැන්වීම වැනි ක්ෂේත්‍රවල දියුණුවට දායක විය. තවදුරටත් ක්‍රියාව සඳහා වේදිකාව ක්‍රියාත්මක කිරීමෙන් උගත් පාඩම් මත පදනම්ව, එහි ප්‍රගතිය වේගවත් කිරීම සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර පහක් හඳුනා ගන්නා ලදි. ඒවා නම්; ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස් ආකාරයෙන් සැලකීමේ සමාජ සම්මතයන් වෙනස් කිරීම; ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ආර්ථිකය බල ගැන්වීම; සෑම තරාතිරමකම තීරණ ගැනීමේදී කාන්තාවන්ට පූර්ණ හා සමාන සහභාගීත්වය ලබා දීම; ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම සඳහා ආයෝජන අවස්ථා බහුල කිරීම; කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ මානව හිමිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා වගවීම යනාදී වේ (UN Women, 2015). එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන ඉලක්ක (MDGs) සහ පසුව තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) පිහිටුවා ගැනීමේදී ස්ත්‍රී

පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හා සම්බන්ධ නිශ්චිත ඉලක්ක ඇතුළත් කිරීමට ඉහත සඳහන් මුල් කාලීන පියවරයන්ගෙන් ලැබුනු දායකත්වය ඉමහත් වේ.

වසර 2000 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සහශ්‍ර සංවර්ධන ඉලක්ක පිහිටුවා ගන්න ලදි. සහශ්‍ර සංවර්ධන ඉලක්ක යනු 2000 වසරේ දී එක්සත් ජාතීන්ගේ සහස්‍ර සමුළුවෙන් ආරම්භව, 2015 වසර වන විට සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් පිහිටුවන ලද ජාත්‍යන්තර සංවර්ධන ඉලක්ක අටකි. ඒවා දිළිඳුකම, කුසගින්න, රෝග, ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අධ්‍යාපනය සහ පිරිසිදු ජලය සඳහා ප්‍රවේශය නොමැතිකම වැනි පුළුල් පරාසයක ගෝලීය අභියෝගවලට විසඳුම් සෙවීම අරමුණු කර ගෙන ලෝක නායකයන් එක්ව පිහිටුවා ගැනිණ (United Nations, 2011).

ඉන් පසු වසර 2016 සිට 2030 දක්වා බලාත්මක වන පරිදි තිරසාර සංවර්ධන ඉලක්ක සමග ඒකාබද්ද වීමට ලෝක නායකයන් එකඟතාවය ඇති කරගන්න ලදි. 2030 වන විට දිළිඳුකම, දේශගුණික විපර්යාස සහ සම්පත් බෙදීයාමේ අසමානතාවය වැනි ගෝලීය අභියෝගවලට විසඳුම් සෙවීම තිරසාර සංවර්ධන ඉලක්කයන්හි අරමුණයි (The International Institute for Sustainable Development, 2016). 2015 දී සාමාජික රටවල් 193 විසින් සාකච්ඡා කර අනුමත කරගන්නා ලද තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීම තුළින් වඩාත් සාධාරණ, යුක්ති සහගත සහ තිරසාර ලෝකයක් කරා ගමන් කිරීමට මෙම සාමාජික රටවල් ගිවිසුම් ගත වේ. තිරසාර සංවර්ධනය සඳහා වූ න්‍යාය පත්‍රය, තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් සහ ඒවායේ අනු ඉලක්ක 169ක් සහ දර්ශක 232කින් සමන්විත වේ. එය තිරසාර සංවර්ධනය ආර්ථික, සමාජීය, පාරිසරික සහ දේශපාලනික මානයන් විස්තීර්ණ හා ඒකාබද්ධ ආකාරයකින් ආමන්ත්‍රණය කිරීම අරමුණු කරයි. එම න්‍යාය පත්‍රයේ පරිවර්තනීය දැක්ම ලබා දීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රධාන වන බැවින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම එක් එක් ඉලක්ක 17 සඳහා විවිධ අයුරින් ආමන්ත්‍රණය කර තිබේ (The International Institute for Sustainable Development, 2016).

ගෝලීය ජනගහනයෙන් අඩක් පමණ කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගෙන් සමන්විත වන අතර, තිරසාර සංවර්ධන ඉලක්ක සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සමානව බලගැන්වීමේ අවශ්‍යතාවය මෙමගින් මැනවින් හඳුනා ගනී. කාන්තාවන් සහ ගැහැණු ළමයින් සංවර්ධනයේ නියෝජිතයන් වීමට නම් ඔවුන්ගේ ආදානය වැදගත් ලෙස සැලකිය යුතු බව මින් අවධාරණය කෙරේ. ඔවුන් 'ප්‍රතිලාභීන්' හෝ 'අවධානමට ලක්විය හැක' කණ්ඩායමක් ලෙස පමණක් සැලකිය යුතු නොවන අතරම, ඔවුන් තිරසාර සංවර්ධනය සඳහා සමාන හවුල්කරුවන් සහ වටිනා දායකයින් ලෙස සැලකිය යුතුය (Soroptimist International, ND). ඵලදායී ප්‍රජා පාදක තිරසාර සංවර්ධන ක්‍රියාමාර්ග මෙහෙයවීමේදී කාන්තාවන්ට අවස්තා පුළුල් කිරීම මගින් තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා බිම් මට්ටමේ ප්‍රජා ධාරිතාව වැඩි කළ හැක. සමාජයට පුරවැසියන් බිහිකිරීමේ කුඩාම ඒකකය පවුලයි එබැවින් මව බලගැන්වීම සහ දැනුම්වත් කිරීම කාලීන ලෙස වැදගත් පියවරකි.

ලොව පුරා කාන්තාවන් මුහුණ දෙන ආගමික සංස්කෘතික බැඳීම් අභිභවා කාන්තාවන්ගේ ප්‍රගමනය වෙනුවෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ බලගැන්වීමේ අවශ්‍යයතාවය තිරසාර සංවර්ධනය ඉලක්ක තුළ හුවා දක්වා ඇත. මෙහිදී තිරසාර සංවර්ධන ඉලක්ක 17 අතුරින්, 5වන ඉලක්කය මූලිකවම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම මූලිකවම අරමුණ කරගත්තකි. එහි අනු ඉලක්ක කාන්තා අයිතිවාසිකම්, අවස්ථා සහ යහපැවැත්ම පිළිබඳ විවිධ අංශ ආමන්ත්‍රණය කරන පරිදි පෙළගස්වා ඇත.

5.1 ඉලක්කය; සියලුම කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහිව සෑම ආකාරයේ වෙනස් කොට සැලකීම් සහ ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම අරමුණු කරයි.

5.2 ඉලක්කය; පොදු සහ පෞද්ගලික අවකාශ දෙකෙහිම දක්නට ලැබෙන ජාවාරම් සහ ලිංගික හා ශ්‍රම සූරාකෑම් ඇතුළු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි සියළු ආකාරයේ හිංසනයන් ඉවත් කිරීම ඉලක්ක කරගනී.

5.3 ඉලක්කය; විවිධ ප්‍රදේශවල දක්නට ලැබෙන ළමා විවාහ සහ කාන්තා ලිංගික ඡේදනය වැනි හානිකර ක්‍රියා ඇතුළු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම මෙම ඉලක්කය මගින් අරමුණු කරයි.

5.4 ඉලක්කය; ගෘහ කටයුතු හා දරුවන්ට රැකවරණය ලබාදීම වැනි වැටුප් නොලබන අංශ හඳුනා ගැනීම සහ එම කටයුතු අගය කිරීම, කුටුම්භ තුළ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම හවුල් වගකීම් ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා කාන්තාවන්ගේ සමාන සහභාගීත්වය සහතික කිරීම අරමුණු කරයි.

5.5 ඉලක්කය; දේශපාලන, ආර්ථික සහ පොදු ජීවිතයේ තීරණ ගැනීමේ දී සෑම තරාතිරමකම කාන්තාවන්ගේ පූර්ණ සහ ඵලදායී සහභාගීත්වය සහ නායකත්වය සඳහා සමාන අවස්ථා සහතික කිරීමට උත්සාහ කරයි.

5.6 ඉලක්කය; ජනගහනය සහ සංවර්ධනය පිළිබඳ සමුළුව සහ ක්‍රියාව සඳහා වේදිකාව බීජිං සමුළුව යන ඒවායේ සමාලෝචන ප්‍රතිඵල ලේඛන අනුව පවුල් සැලසුම් සහ විස්තීරණ ලිංගික අධ්‍යාපනය ඇතුළුව ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතිවාසිකම් සඳහා විශ්වීය ප්‍රවේශය ලබා දීම අපේක්ෂා කරයි.

මීට අමතරව, මෙම ඉලක්කය යටතේ තවදුරටත්, ජාතික නීති රීති වලට අනුකූලව කාන්තාවන්ට ආර්ථික සම්පත් සඳහා සමාන අයිතිවාසිකම් ලබා දීම සඳහා ප්‍රතිසංස්කරණ සිදු කිරීම පිළිබඳ අවධානය යොමු කිරීම සිදුවේ. මෙහිදී ඉඩම් සහ අනෙකුත් දේපල, මූල්‍ය පිළිබඳ අයිතිය, උරුමය සහ ස්වභාවික සම්පත් පාලනය සඳහා ප්‍රවේශය ලබා දීම අපේක්ෂා කරයි. තවද කාන්තාවන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණය භාවිතය වැඩි දියුණු කිරීම, විශේෂයෙන්ම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතය සක්‍රීය කිරීම අරමුණු කර ගනී. තව දුරටත් මෙම ඉලක්කය මගින් සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගැලපෙන ප්‍රතිපත්ති සහ බලාත්මක කළ හැකි නීති සම්මත කර සෑම තරාතිරමකම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ. තිරසාර සංවර්ධනය සඳහා 5 වන ඉලක්කය මගින් මූලික වශයෙන් අවධානය යොමු කරන සාධක හැරුණු කොට අනෙකුත් ඉලක්ක තුළදී ද කාන්තාවන්ගේ යහපැවැත්ම කෙරේ අවධානය යොමු කර ඇත.

ඒ අනුව 4 වන තිරසාර සංවර්ධන ඉලක්කය යටතේ සෑමට ගුණාත්මක අධ්‍යාපනය ලබා දීම පිළිබඳ අවධානය යොමු කරයි. ප්‍රාථමික ශ්‍රේණිවල පාසල් යන වයසේ පිරිමි ළමුන් මිලියන 10කට සාපේක්ෂව ගැහැණු ළමයින් මිලියන 15 කට ප්‍රාථමික පාසලේදී කියවීමට හෝ ලිවීමට ඉගෙන ගැනීමට කිසිදා අවස්ථාවක් නොලැබේ (UN Woman, 2018). ගුණාත්මක අධ්‍යාපනය සඳහා ගැහැණු ළමයින්ගේ සමාන ප්‍රවේශය සහතික කිරීම ඔවුන් සවිබල ගැන්වීමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ බාධක බිඳ දැමීමට අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන්ම පවුල් ඒකකයක දරුවන්ට රැකවරණය සහ ආරක්ෂාව නිරන්තරයෙන් සපයන මව හෝ කාන්තාව සාක්ෂරතාවයෙන් යුතු වීම ඇය යටතේ වැඩෙන දරුවන්ගේ අධ්‍යාපනයට රුකුලක් වේ. ඒ හැරුණු කොට දරුවන්ගේ සෞඛ්‍ය තත්ව වලදීද මවගේ දැනුම්වත්භාවය අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්වේ. තවද ගැහැණු ළමයින් පශ්චාත්-ප්‍රාථමිකයේ ගතකරන සෑම අමතර වසරක්ම කාන්තා රැකියා නියුක්තිය ඉහළ දැමීම, අඩු වයස් විවාහ සහ ඔවුන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම පිළිබඳ වැඩි අවධානයෙන් යුතු කාන්තාවන් බිහිකිරීම ඇතුළු සාර්ථක බලපෑම් ඇති කිරීමෙහිලා සමත් වී ඇති බව පර්යේෂණ වාර්ථා තහවුරු කරයි (UN Woman, 2018).

සෞඛ්‍ය සහ යහපැවැත්ම යටතේ වන තිරසාර සංවර්ධන 3 ඉලක්කය කාන්තාවන්ගේ සෞඛ්‍ය හා ජීවන තත්වය ඉහළ දැමීම පිළිබඳ අවධානය යොමු කරයි. 2015 දී ගර්භණීභාවය හා සම්බන්ධ සෞඛ්‍ය හේතූන් මත ගෝලීය වශයෙන් කාන්තාවන් 303,000ක් මිය ගොස් ඇත (UN Woman, 2018). ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය සේවා ඇතුළු සෞඛ්‍ය සේවා සඳහා කාන්තාවන්ට ඇති ප්‍රවේශය කාන්තාවන්ගේ යහපැවැත්ම, සමාන අවස්ථා සහ ජීවන තත්වය කෙරෙහි තීරණාත්මක බලපෑම් එල්ල කරයි. විශේෂයෙන්ම ලිංගික අධ්‍යාපනය ගැහැණු දරුවන්ගේ ජීවිත කෙරෙහි එල්ලකල හැකි බලපෑම විශාල වේ. සංවර්ධනය වෙමින් පවතින රටවල් බහුතරයකම ළමා මව්වරුන් බිහිවීම කෙරේ ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ අධ්‍යාපනය ඉතා අවම මට්ටමක පැවතීම හේතු වී තිබේ. 3 වන තිරසාර සංවර්ධන ඉලක්කය යටතේ ඇති අනු ඉලක්ක 13 න් කාන්තාවන්ගේ සෞඛ්‍ය අභිවෘද්දිය ලඟා කරගැනීම සඳහා දර්ශක 6ක් දක්වා තිබේ.

තිරසාර ආර්ථික වර්ධනය සහ සියළු දෙනාටම ඵලදායී රැකියා ප්‍රවර්ධනය කිරීම 8 වන තිරසාර සංවර්ධන ඉලක්කය යටතේ අරමුණු කරයි. ගෝලීය ස්ත්‍රී පුරුෂ වැටුප් පරතරය 23% කි. භූගෝලීය හා දේශපාලන කලාප අතර විශාල වෙනස්කම් දක්නට ලැබුනත් පොදුවේ ගත්කල කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 63% වන අතර පිරිමින්ගේ

සහභාගීත්ව අනුපාතය 94% කි (UN Woman, 2018). මෙම ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය අතර පවතින විශාල පරතරය ස්ත්‍රී පුරුෂ ආර්ථික පරතරය පුළුල් කිරීමේ ප්‍රධාන සාධකය වේ. කාන්තාවන් සඳහා යහපත් රැකියාවක් ප්‍රවර්ධනය කිරීම, ස්ත්‍රී පුරුෂ වැටුප් පරතරය අවම කිරීම සහ කාන්තා ව්‍යවසායකයින්ට සහාය වීම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ වැදගත් අංග ලෙස තිරසාර සංවර්ධනයේදී හඳුනා ගැනේ. තිරසාර ආර්ථික වර්ධනය සහ ඵලදායී රැකියා ස්ථාපිත කිරීමේ දී අනු ඉලක්ක 12 හඳුන්වා දී ඇති අතර, දර්ශක 7ක් කාන්තාවන් ඉලක්ක කරගෙන ක්‍රියාත්මක වේ. එක්සත් ජාතීන්ගේ සහ ලෝක බැංකු අධ්‍යයනවලින් පෙනී යන්නේ දරිද්‍රතාවය අවම කිරීමේ උපාය මාර්ග සඳහා කාන්තාවන් කෙරෙහි අවධානය යොමු කිරීම ස්ත්‍රී පුරුෂ සමාජභාවය මධ්‍යස්ථ මට්ටමකට ගෙන ඒමට රුකුල් දෙනවාටත් වඩා ආර්ථික වර්ධනය වේගවත් කිරීමට තුඩු දෙන කරුණක්ව ඇති බවයි.

10 වන ඉලක්කය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය අතර පවතින අසමානතා අවම කිරීම අරමුණු කරගෙන ඇත. බොහෝ විට කාන්තාවන්ට අසමාන ලෙස බලපාන ආදායම් සහ ධන විෂමතා ආමන්ත්‍රණය කිරීම සමාන අවස්ථා සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ. ධනවත් රටවල් හා දියුණු වෙමින් පවතින රටවල් අතර පවතින ඇති නැති පරතරයට අමතරව කුටුම්භ ඒකකයන් තුල පවා ආදායම් විෂම තත්වයන් පවතින බව හෙළි වී ඇත. කාන්තාවන් පුරුෂයන්ට වඩා අඩුවෙන් ඉපයීම හේතුවෙන් ඔවුන්ට අඩු වත්කම් ප්‍රමාණයක් හිමිවන අතරම අවශ්‍යතා සපුරා ගැනීම අතින්ද සීමිත අවස්තා සහිත වේ. සමස්ථයක් වශයෙන් ගත්කල ලොව පුරා කාන්තාවන්ට පුරුෂයන් ලබන මධ්‍ය ආදායමෙන් සියයට 50 ට අඩුවෙන් උපයා ජීවත්වීමට සිදුව තිබේ (UN Women, 2018).

දේශගුණික විපර්යාස වලට එරෙහිව සටන් කිරීම 13 වන ඉලක්කයේ මූලික අරමුණ වේ. ආන්තික කාලගුණික සිදුවීම් යනුවෙන් හඳුන්වන නියඟ හා ගංවතුර තත්ව මෙන්ම ස්වභාවික විපත් ඇතුළුව සැලකිය යුතු දේශගුණික වෙනස්කම් වලදී කාන්තාවන්ගේ මරණ අනුපාතය පුරුෂයන්ට වඩා 14 ගුණයකින් විශාල වේ (UN Woman, 2018). කාන්තාවන් බොහෝ විට දේශගුණික විපර්යාස හේතුවෙන් පුරුෂයන්ට වඩා පීඩාවට පත් වන අතර, දේශගුණික ගැටළු වලට මුහුණ දීමේදී කාන්තාවන්ගේ සුවිශේෂී දුර්වලතා සහ දායකත්වය සලකා බැලීමෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කළ හැකි බව 13 වන ඉලක්කයේදී හඳුනා ගැනේ. ඒ හැරුණු කොට විශේෂයෙන්ම ආසියාවේ සහ අප්‍රිකාවේ, රැකියා නියුක්ත කාන්තාවන්ගෙන් බහුතරයක් කෘෂිකර්මාන්තය මත යැපෙන අතර පුරුෂයන්ට වඩා සාපේක්ෂ වශයෙන් විශාල කොටසක් කාන්තාවන් කෘෂිකර්මාන්තයට අදාළ වෘත්තීන් නියෝජනය කරයි (UN Woman, 2018). එබැවින් ආන්තික කාලගුණික තත්වයන් කෘෂිකර්මාන්තයේ නියැලී සිටින කාන්තාවන්ගේ ජීවනෝපායට සෘජුව බලපෑම් එල්ල කරයි. බොහෝ කාන්තා කෘෂිකාර්මික කම්කරුවන් මුහුණ දෙන ඉඩම් සඳහා ප්‍රවේශය, ණය, පොහොර, ජලය වැනි අත්‍යවශ්‍ය යෙදවුම් සදහා විසඳුම් සපයා දීම මෙම ඉලක්කයෙන් අපේක්ෂා කෙරේ. එමෙන්ම දේශගුණික විපර්යාස වලට මුහුණ දීමට අවශ්‍ය කෘෂිකාර්මික තාක්ෂණය, තොරතුරු සහ වෙළෙඳපොළ සකසාදීම මගින් කාන්තා ශ්‍රමිකයන් සවිබල ගැන්විමද දේශගුණික විපර්යාස වලට තිරසාර විසදුම් සපයා දීමද ඉලක්ක ගත වේ.

තිරසාර වර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වයේ අවශ්‍යතාව 17 වන ඉලක්කය මගින් මතු කරයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉදිරියට ගෙන යාමට සහ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට සමාන අවස්ථා සහතික කිරීමට රජයන්, සිවිල් සමාජය අතර සහයෝගීතාවය අත්‍යවශ්‍ය වේ. සංවර්ධනය වෙමින් පවතින රටවලට මූල්‍ය වශයෙන් සහාය වීම සඳහා විවිධ සංවර්ධිත රටවලින් මූලාශ්‍රවලින් බලමුළු ගන්වනු ලැබේ. එම සම්පත්වලින් කොපමණ ප්‍රමාණයක් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සඳහා යොදවන්නේද යන්න විමසා බැලීම මෙම ඉලක්කය තුලින් අරමුණු වේ.

මෙම ප්‍රධාන ඉලක්ක හැරුණු කොට අනෙකුත් ඉලක්ක මගින්ද කාන්තාවගේ අවශ්‍යතා ආමන්ත්‍රණය කර තිබෙනු දක්නට ලැබේ. එහිදී 7 වන ඉලක්කය පිරිසිදු බලශක්තිය සඳහා ප්‍රවේශය ලබා ගැනීම පිළිබඳ අවධානය යොමු කරයි. ගෘහස්ථ බලශක්තිය ලෙස ආහාර සැකසීම සඳහා වියළි දර, ගොම වැනි දෑ භාවිතයෙන් ඇතිවන ගෘහස්ථ වායු දූෂණය හේතුවෙන් 2012 දී මිලියන 4.3 ක් මිය ගොස් ඇත, මියගිය සෑම 10 දෙනෙකුගෙන් 6 ක්ම කාන්තාවන් වේ (UN Woman, 2018). විශේෂයෙන්ම දර ඉන්ධන භාවිතය හේතුවෙන් ඇති වන ගෘහස්ත වායු

දූෂණය ගම්බද ආසියාතික කාන්තාව අතර ස්වසන පද්ධතිය හා සම්බන්ධ රෝග ඉහළ යාමට හේතු වී ඇත. පිරිසිදු හා ලාභදායී බලශක්ති ප්‍රේරණය කිරීම කාන්තාවන්ට සෞඛ්‍යමය වාසි අත්කරදෙනු ඇත. තවද කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශයක් ලබා දීම 9 වන තිරසාර සංවර්ධන ඉලක්කයෙන් අරමුණු කෙරේ. ලොව පුරා පර්යේෂකයින්ගෙන් 28.8% ක් පමණක් කාන්තාවන් විසින් නියෝජනය කරන අතර එම අංශයෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලබාගෙන ඇත්තේ රටවල් 5 කින් 1ක් පමණි.

2 වන තිරසාර සංවර්ධන ඉලක්කය වන තිරසාර කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව පැහැදිලිවම කාන්තාවන් කෙරෙහි අවධානය යොමු නොකලද, එය ආහාර සුරක්ෂිතතාව සහ තිරසාර කෘෂිකර්මාන්තය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයට බලපාන ආකාරය හඳුනා ගනී. මේ යටතේ වන ඉලක්ක සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් සහ දායකයින් ලෙස කාන්තාවන් ඉලක්ක කරයි. ලොව රටවලින් තුනෙන් දෙකකට ආසන්න ප්‍රමාණයක්, පුරුෂයන්ට වඩා කාන්තාවන් ආහාර අතින් අනාරක්ෂිත බව හෙළි වී ඇත. භූ ගෝලීය කලාප අතරින් බලනවිට ආහාර අනාරක්ෂිතතාවයේ ඉහළම ව්‍යාප්තිය උප සහරානු ප්‍රදේශයෙන් හඳුනාගත හැකිය (UN Woman, 2018). එපමණක් නොව කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන් ගෝලීයව මන්දපෝෂණය පැතිරීම 2019 සිට 2020 දක්වා දෙවසර තුළ 8% සිට 9.3% දක්වා ඉහළ ගියේය. එම අගය 2020 සිට 2021 දක්වා 9.8% දක්වා නැවත ඉහළ ගොස් තිබෙනු දක්නට ලැබිණ (FAO et al, 2022). ගෝලීය ආහාර සුරක්ෂිතතා අභියෝගයන්ට මුහුණ දීමේදී කාන්තාවන් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බව ද මෙම ඉලක්කය තුළින් සහතික කරයි.

සාරාංශයක් ලෙස, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබලගැන්වීම තිරසාර සංවර්ධන ඉලක්ක 5 තුළ පමණක් කේන්ද්‍රීය නොවන අතර අනෙකුත් තිරසාර සංවර්ධන ඉලක්ක සමඟද ඒකාබද්ධ වේ. කාන්තා අයිතිවාසිකම් සහ සමාන අවස්ථා වල වැදගත්කම හඳුනා ගැනීම තිරසාර සංවර්ධන ඉලක්කයන්හි සමස්ථ සාර්ථකත්වයට සහ වඩාත් තිරසර, සමානාත්මතාවයෙන් යුතු ලෝකයක් කරා ගමන් කිරීමේදී මූලික වේ.

**සාර්ථක ගෝලීය වැඩසටහන්**

කාන්තාවන්ගේ තත්ත්වය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා ගෝලීය වශයෙන් සාර්ථක සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඇත. මෙම මුලපිරීම් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවයේ සිට ආර්ථික සවිබල ගැන්වීම් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැලැක්වීම දක්වා පුළුල් පරාසයක ගැටළු වලට විසඳුම් සපයයි.

එම ගෝලීය ප්‍රයත්නයන් කිහිපයක් පහත පරිදි වේ.

**1. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනය** (UN Woman): ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ ආයතනය, UN Women ලෙස හැඳින්වේ. එය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා ක්‍රියා කරන එක්සත් ජාතීන්ගේ ආයතනයකි. 2010 ජූලි මස ආරම්භ කල මෙම ආයතනය එක්සත් ජනපදයේ නිව් යෝර්ක් නගරය මූලස්ථාන කොටගෙන ක්‍රියාත්මක වේ. එය "අපි ආසියාව සවිබල ගන්වමු" වැනි වැඩසටහන් හරහා කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම, දේශපාලනයේ සහ තීරණ ගැනීමේ කාන්තා සහභාගීත්වය වැඩි කිරීම සහ ආර්ථික සවිබල ගැන්වීම් ඉලක්ක කරගත් වැඩසටහන් සඳහා සහාය දක්වමින් ක්‍රියාත්මක වේ (UN Women, 2018).

**2. අධ්‍යාපනය සඳහා වන ගෝලීය හවුල්කාරිත්වය** (Global Partnership for Education): මෙය අඩු ආදායම්ලාභී රටවල් යහපත් මට්ටමට පරිවර්තනය කිරීම සඳහා කැප වූ විශාලතම ගෝලීය අරමුදලයි. ලොව පුරා ගැහැණු ළමයින්ට සහ පිරිමි ළමයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලැබෙන බව සහතික කිරීමට මෙම හවුල්කාරිත්වය ක්‍රියා කරයි. එය අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතා ආමන්ත්‍රණය කරන වැඩසටහන්වලට සහය වන අතර බොහෝ රටවල ගැහැනු ළමයින්ට පාසල් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ප්‍රවර්ධනය කරයි (Global Partnership for Education, 2022).

**3. ඔහු ඇය වෙනුවෙන්** (HeForShe): UN Women ආයතනය විසින් දියත් කරන ලද HeForShe යනු කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට ඔවුන්ගේ හැකියාවන් සාක්ෂාත් කර ගැනීම වළක්වන සමාජ හා සංස්කෘතික බාධක ඉවත් කිරීමට පුරුෂයන් සහ පිරිමි ළමයින්

සම්බන්ධ කර ගැනීමටත්, එමඟින් සමාජය ධනාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමටත් ගත් ගෝලීය උත්සාහයකි. එය කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට සහාය වීම සඳහා නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීමට පුරුෂ පාර්ශවය දිරිමත් කරයි.

**4. අධ්‍යාපන මූලපිරීම්:** මලාලා අරමුදල සහ ගැහැණු ළමයින්ට ඉගෙනීමට ඉඩ දෙන්න වැඩසටහන වැනි විවිධ සංවිධාන, සියළුම ගැහැණු ළමයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය සහතික කිරීම සඳහා කැපවී සිටිති. මලාලා අරමුදල යනු ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පෙනී සිටින ජාත්‍යන්තර, ලාභ නොලබන සංවිධානයකි. එය කාන්තා අධ්‍යාපනය සඳහා වන පකිස්ථාන ක්‍රියාකාරිනියක් මෙන්ම ලොව ලාබාලතම නොබෙල් ත්‍යාගලාභිනිය වන මලාලා යූසුෆ්සායි (Malala Yousafzai) සහ ඇගේ පියා සියාඋද්දීන් (Ziauddin) විසින් ආරම්භ කරන ලදී. ගැහැණු ළමයින්ට ඉගෙන ගැනීමට ඉඩ දෙන්න (Let Girls Learn) යනු නව යොවුන් වියේ ගැහැණු ළමයින්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට උපකාර වන එක්සත් ජනපද රජයේ මූලපිරීමකි. හිටපු ජනාධිපති ඔබාමා (Barack Obama) සහ ජනාධිපති ආර්යාව මිෂෙල් ඔබාමා (Michelle Obama) විසින් දියත් කරන ලද මෙම වැඩසටහන ගැහැණු ළමයින්ගේ අධ්‍යාපනය සහ ඒ තුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම පිළිබඳ ගෝලීය ප්‍රතිපත්ති සුරැකීම පිළිබඳව ක්‍රියාත්මක වේ. ලිංග භේදයකින් තොරව සියලුම දරුවන්ට හොඳ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා ගැනීමට සහ අධ්‍යාපනය තුළ සහ ඒ තුළින් සමානව බලගැන්වීමට හැකි වන පරිදි අධ්‍යාපන ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැලසුම් කිරීමේදී සහාය විය හැකි යෝජනා, නිර්දේශ සහ දත්ත රජයන්ට සැපයීම මෙමගින් මූලිකවම සිදුවේ (Cowley, 2021).

**5. කාන්තා ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන්:** ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (The International Finance Corporation) (IFC, 2023) සහ කාන්තා ලෝක බැංකුකරණය (Womenzs World Banking) (WWB, 2023) වැනි සංවිධාන මූල්‍ය සේවා, ව්‍යාපාරික සහාය සහ ව්‍යවසායකත්ව පුහුණුව තුළින් කාන්තාවන්ගේ ආර්ථික ප්‍රවර්ධනය කිරීමට සහයෝගය දක්වයි.

**6. #MeToo ව්‍යාපාරය:** සමාජ මාධ්‍ය තුල #MeToo හැෂ් ටැගය මඟින් විශාල ප්‍රසිද්ධියක් ලබූ මෙම මෙම ගෝලීය ව්‍යාපාරය ලිංගික අතවර සහ පහරදීම්වලට එරෙහිව හඬක් නැගූ ව්‍යාපාරයකි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳව දැනුවත් කිරීම සහ ප්‍රචණ්ඩ ක්‍රියා වලින් දිවි ගලවා ගත් අයට ඔවුන්ගේ කථා බෙදා ගැනීමට වේදිකාවක් මෙමගින් නිර්මාණය කර ඇත.

**7. ආරක්ෂිත නගර මූල පිරීම්:** එක්සත් ජාතීන්ගේ කාන්තාවන් විසින් සුරක්ෂිත නගර සහ සුරක්ෂිත පොදු අවකාශයන් සඳහා ගෝලීය මූලපිරීම (Safe Cities and Safe Public Spaces Global Initiative) වැනි වැඩසටහන් මගින් පොදු ස්ථානවල කාන්තාවන්ට සිදුවන ලිංගික හිරිහැර, හිංසන වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම අරමුණු කරයි. තවද නාගරික ප්‍රදේශ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින් සඳහා ආරක්ෂිත ස්ථාන බවට පත් කිරීම අරමුණු කරයි (UN Women, 2020).

**8. පවුල් සැලසුම් සහ ප්‍රජනක සෞඛ්‍ය වැඩසටහන්:** එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) වැනි සංවිධාන කාන්තාවන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා පවුල් සැලසුම් සේවා, මාතෘ සෞඛ්‍ය සහ ප්‍රජනක අයිතිවාසිකම් සුරැකීම සඳහා සහාය දක්වයි.

**9. UNICEF හි "ළමා විවාහ අවසන් කරන්න" ව්‍යාපාරය:** ලෝකයේ බොහෝ ප්‍රදේශවල ගැහැණු ළමයින්ට අසමානුපාතික ලෙස බලපාන ළමා විවාහ නැවැත්වීම සඳහා දැනුවත් කිරීම සහ බලමුළු ගැන්වීම සඳහා එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා හදිසි අරමුදල (UNICEF) මගින් 2016 දී ආරම්භ කරන ලදි.

**10. ප්‍රජා පාදක මැදිහත්වීම්:** ප්‍රාදේශීය බිම් මට්ටමේ සංවිධාන සහ ප්‍රජා මූලපිරීම් බොහෝ විට බිම් මට්ටමේ කාන්තාවන් සවිබල ගැන්වීමට ප්‍රබල බලපෑමක් ඇති කරයි. ඔවුන් කාන්තා අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා ප්‍රවේශය, ආර්ථික සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වැනි කාරණා සම්බන්ධයෙන් කටයුතු කරයි.

ඉහත වැඩසටහන් ගෝලීය වශයෙන් කාන්තාවන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම ඉලක්ක

කරගත් සාර්ථක තිරසාර සංවර්ධන මුලපිරීම් සඳහා උදාහරණ කිහිපයක් පමණි. කාන්තාවන් බලගැන්වීමේ වැඩසටහන් වල සාර්ථකත්වය; විස්තීරණ ප්‍රවේශයන් ගැනීම, බහු පාර්ශ්වකරුවන් අතර සහයෝගීතාව ඇතිකිරීම, ප්‍රජා සහභාගීත්වය වැඩි කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය ස්ථාවර කිරීම වැනි බහුවිධ සාධකවල බලපෑම මත තීරණය වේ.

කාලනුරූපීව සිදුවූ මෙම මුලපිරීම් මගින් කාන්තාවන් සහ ගැහැණු ළමයින් මුහුණ දෙන බහුවිධ අභියෝග හඳුනා ගනිමින් ඒවාට කලෝචිත, ස්ථිර විසඳුම් සෙවීමට අවකාශ ලැබී ඇති අතර, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කරමින් තිරසාර සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීමද සිදු වේ. ඉහත කී ප්‍රයත්නයන්ගෙන් අදාළ පාර්ශව ප්‍රතිලාභ ලබන්නේද යන්න විමසා බැලිය යුතු අතර, ඒ සඳහා තිරසාර සංවර්ධන ඉලක්කයන් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ රජයන්, ආයතන, පුද්ගලික අංශය ඇතුළුව අනෙකුත් පාර්ශවකරුවන්ගේ දත්ත රැස් කල යුතුය. ගුණාත්මක හා ප්‍රමාණාත්මක දර්ශක, ප්‍රාථමික දත්ත මෙන්ම ආයතනික දත්ත රැස් කර විශ්ලේෂණය කිරීම මගින් කාලානුරූපීව මෙම වැඩසටහන්වල සාර්ථකත්වය විමසා බැලීම හා එමගින් අනාගත සැලසුම් සහ යෝජනා යාවත්කාලීන කල යුතුය. මීට අමතරව, සංවර්ධන වැඩසටහන් සකස් කිරීමේදී ජාතික, කලාපීය සහ ගෝලීය වශයෙන් ස්ත්‍රී පුරුෂ භාවය සැලකෙන සංඛ්‍යාලේඛන සහ සහ දර්ශක එකතු කිරීම වැදගත් වේ. කාන්තාවන් සහ ගැහැණු ළමයින් අත්විඳින බහුවිධ අසමානතා නිරීක්ෂණය කිරීමට වයස, ස්ත්‍රී පුරුෂ භාවය, භූගෝලීය පිහිටීම, ආදායම, ආබාධිත තත්වයන්, ජාතිය සහ වාර්ගිකත්වය වැනි අදාළ අනෙකුත් බාහිර සාධක ද සළකා බැලිය යුතුය. කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට වෙනස් කොට සැලකීම සාධාරණීකරණය කිරීමට ආගම හෝ සංස්කෘතිය අනිසි ලෙස භාවිතා නොකළ යුතුය. විශේෂයෙන්ම කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා ක්‍රියාත්මක වන නීති සහ ප්‍රතිපත්තිවල බලපෑම් සහ ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම සඳහා රාජ්‍යයන් සැලකිලිමත් විය යුතුය. එසේ කිරීමෙන්, සෑම කාන්තාවකටම සහ ගැහැණු ළමයෙකුටම වෙනස් කොට සැලකීමෙන් සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර, ඔවුන්ගේ දායකත්වය අගය කොට සළකනු ලබන හා ඔවුන්ගේ පූර්ණ හැකියාවන් කරා ළඟා වීමට අවස්ථාව ඇති අනාගතයක් සඳහා ගෝලීයව ළඟාවිය හැකිය.

සාරාංශයක් ලෙස, කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ගෝලීය මුලපිරීම් කාන්තාවන්ගේ යහපැවැත්ම සඳහා පමණක් නොව, සමස්තයක් ලෙස පොදු සමාජයේ ප්‍රගතිය සහ සමෘද්ධිමත් භාවය සඳහා ද වැදගත් වේ. සෑම අතින්ම සවිබල ගැන්වූ කාන්තාවන් ශක්තිමත් ආර්ථිකයන් ගොඩනැගීමට, සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවන් බිහිකිරීමට මෙන්ම සහ වඩාත් තිරසර රාජ්‍යයන් ගොඩ නැගීම සඳහා දායක වන අතර, සෑම මනුෂ්‍යයෙකුටම වඩා හොඳ ජීවන තත්ත්වයක් සඳහා මග පාදයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


Cowley, A. (2021). *Let girls learn! report*, Save the Children, United Kingdom. https://resourcecentre.savethechildren.net/document/let-girls-learn/

FAO, IFAD, UNICEF, WFP & WHO. (2022). The state of food security and nutrition in the world 2022; Repurposing food and agricultural policies to make healthy diets more affordable. Rome, FAO. https://doi.org/10.4060/cc0639en

Global Partnership for Education. (2022). *Results Report.* https://assets.globalpartnership.org/s3fs-public/document/file/gpe-results-report-2022-en.pdf

International Finance Cooperation. (2023). *Building A Better Future*, Washington, U.S. https://www.ifc.org/content/dam/ifc/doc/2023/ifc-annual-report-2023-building-a-better-future.pdf

Rampton, M. (2015, October 25). Four waves of feminism, *Pacific University Web.* https://www.pacificu.edu/magazine/four-waves-feminism

Morgan, A. (2015). *Seneca falls convention: the beginning of the women's rights movement or a "Conversation older than the nation itself".* https://www.eiu.edu/historia/Morgan2015.pdf

The International Institute for Sustainable Development. (2016). *Sustainable development goals; IISD perspectives on the 2030 agenda for sustainable development.*

https://www.iisd.org/system/files/publications/sustainable-development-goals-iisd-prespectives.pdf

The World Bank. (2023). *Population, female (% of total population),* The world Bank Group. https($$genderdata'worldbank'org$indicators$sp-pop-totl-fe-zs$@view}trend

United Nations. (1996). *Report of the Fourth World Conference on Women*, New York. https://documents-dds-ny.un.org/doc/UNDOC/GEN/N96/273/01/PDF/N9627301.pdf?OpenElement

United Nations. (2011). *The Millennium Development Goals Report,* New York. https://www.refworld.org/pdfid/4e42118b2.pdf

UN Women. (2015). *Summary report: the Beijing declaration and platform for action turns 20*, New York.
*https://sustainabledevelopment.un.org/content/documents/1776The%20Beijing%20Declaration%20and%20Platform%20for%20Action%20turns%2020.pdf*

UN Economic and Social Commission for Asia and the Pacific. (1987). *Achievements of the United Nations decade for women in Asia and the Pacific*. Retrieved from: https://hdl.handle.net/20.500.12870/4357.

UN Women. (2018). *Turning promises into action: Gender equality in the 2030 agenda for sustainable development*, United States. www.unwomen.org/sdg-report

UN Women (2020). *Safe Cities and Safe Public Spaces for Women and Girls Global Flagship Initiative: Second International Compendium of Practices.* New York. https://observatoirevivreensemble.org/sites/default/files/safe-cities-and-safe-public-spaces-international-compendium-of-practices-02-en_2.pdf

Womens World Banking. (2023). "Defining women's social and economic empowerment: Championing the empowered woman". *https://www.womensworldbanking.org/*